# ඉදිකිරිම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා ඒවායේ ඇතිවිය හැකි දෝෂ

තුන්වන පාඩම (පළමු කොටස)






නූතනයේ විවිධ ඉදිකිරීම් කටයුතු සඳහා



- දැව
- ගඩොල්
- කොන්ක්‍රීට්



ඇතුළු බොහෝ දේ භාවිතයට ගැනීම සිදුවේ.



1) දැව වල අඩංගු ස්වභාවික ගුණාංග මොනවාද

- ශක්තිය

දැව ආතන්‍ය ප්‍රත්‍යා බල හා සම්පීඩන ප්‍රත්‍යා බල වලට ඔරොත්තු දෙයි. දැව මෘදු දැව සහ තද දැව වශයෙන් විශේෂ පවතී.

- කල්පැවැත්ම

කාලගුණ හා දේශගුණ විපර්යාස වලට ඔරොත්තු දෙමින් දිගු කාලයක් පවත්වා ගැනීම. දිලීර ,බැක්ටීරියා ,කෘමි උවදුරු වලට ඔරොත්තුදීමේ හැකියාව නිසා දැව හානියට පත් නොවේ.

- දැඩි බව

සමහර දැව වල මාංශ තද බව නිසා කැපීම , විදීම යන ක්‍රියාවන් සඳහා අපහසු තාවයක් දක්වයි මෙය දැඩි බව ලෙස හඳුන්වයි.

## නැමෙන සුළු බව

දැන් ඒක බරක් ඇදීමේ දී එහි නැමීම සහ ඇඹරීම සිදුවේ එම බර ඉවත් වීමෙන් නැවත යථා තත්ත්වයට පත් විය හැකිය. දැව මාංශ වල පවතින කෙඳි වල තත්ත්වය හා විශේෂ ගුණය හේතුවෙන් ද නැමෙන සුළු බව දක්නට ලැබේ.

## අලංකාරය

දැව වල පවතින වර්ණ, වයිරම්, නහර නිසා මතුපිට අලංකාරය ලබා දෙයි.

1)ශාක වර්ධනය වන ක්‍රමය හා කන්ද හි බාහිර හා අභ්‍යන්තර සුරූපය අනුව වර්ග 2කි ඒවා මොනවාද

ඒක බීජ පත්‍රී ශාක



ද්වි බීජ පත්‍රී ශාක



3) ඒක බීජ හා ද්වි බීජ පත්‍රී ශාක වල දක්නට ලැබෙන ලක්ෂණ ලියන්න.

| ඒක බීජ පත්‍රී ශාක | ද්වි බීජ පත්‍රී ශාක |
|---|---|
| • අතු නොබෙදුනු සිදු කන්දක් වීම. | • කන්ද ඇතුලත සිට පිටතට මේරීම සිදුවේ |
| • පත්‍ර පටුව සහ දික්ව පිහිටීම. | • මෙම ශාක බාහිර වෘද්ධි ශාක නමින්ද හඳුන්වයි. |
| • පත්‍ර නාරටි සමාන්තරව පිහිටීම. | • කදෙන් අතු බෙදීම සිදුවේ. |
| • තන්තු මුල් පද්ධතියක් ඇත. | • මුදුන් මූල පද්ධතියක් ඇත. |

4) දැව වල පවතින ශක්තිය අනුව ප්‍රධාන කොටස් 2කි. ඒවා හඳුන්වා උදාහරණ සපයන්න.


**මෘදු දැව**

ලුණුමිදෙල්ල,ඇල්බීසියා
ගිනි සපු

**තද දැව**

පලු ,නැදුන් ,බුරුත,
තේක්ක ,හල්මිල්ල
කොස්

## මෘදු දැව




ලුණුමිදෙල්ල



ඇල්බීසියා



ගිනි සපු

# තද දැව





බුරුත





පලු


නැදුන්



තේක්ක



5) පහත සඳහන් දැව කඳ අභ්‍යන්තර කොටස් නම් කරන්න



1 ☞ අරටුව

2 ☞ එළය

3 ☞ ඉරිමදය

4 ☞ වාර්ෂික වළලු

5 ☞ ඇතුල් පොත්ත

6 ☞ පිට පොත්ත

7 ☞ මජ්ජා කිරණ

6) ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගන්නා කෘතිම දැව වර්ග සඳහන් කරන්න.

තුනී ලෑලි ( fly wood)



ආස්කෘත ලෑලි (laminated board)



## බ්ලොක් බෝඩ් (block board)



## චිප් බෝඩ් (chip board)



## හාර්ඩ් බෝඩ් (chip board)



## මධ්‍ය ඝනත්ව කෙඳි ලෑලි (m.d.f)

